// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2395/06 - 2024 ජූලි මස 29 වැනි සඳුදා - 2024.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: KTS/LAN/NY-J54/10/05/2019.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/17/2019/D/412.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් / පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්**,** 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශතාවේ විස්තර:-*

| | | |
|---|---|---|
| මූලික පිඹුරු අංකය | : | CM 910392 |
| ඉඩම | : | කරම්පන් |
| ග්‍රාමසේවා වසම | : | J/54 කරම්පන් බටහිර |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | කයිට්ස් |
| දිස්ත්‍රික්කය | : | යාපනය |
| පළාත | : | උතුරු පළාත |
| හේතුව | : | නාවික ආරක්ෂක / ශ්‍රී ලංකා නාවික නෞකා කන්වද්දේව කලාපය “C” - කරම්පන්. |

01. කැබලි අංක **01**
ඉඩමේ නම: ඌරුන්ඩ් සහ ඉතිනියෝධ ඌරුන්ඩ්; ඉඩමේ පරිමාණය: උයනේ ස්ථිර ගොඩනැගිලි පහක් ඇත; හිමිකම් කියන්නා: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.4047.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාට තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ **2024 අගෝස්තු** මස **26** වැනි දින **පෙ. ව. 10.00** ට කයිට්ස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා හමු විය යුතුයි.

තවද, **2024 අගෝස්තු** මස **08** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**මංජුලාදේවි සතීසන්,**
ප්‍රාදේශීය ලේකම්,
කයිට්ස්.

2024 ජූලි මස 26 වැනි දින,
කයිට්ස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0276

G 42334 - 22 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: DSWE/LND/2/F1/47 .

1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ 2024.03.12 වැනි දින අංක 2375/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ III වන කොටසේ පළ කරන ලද මාගේ යොමු අංක DSWE/LND/2/F1/47 සහ 2024.03.06 දිනැති දැන්වීමේ සඳහන් පරීක්ෂණ දිනය සහ වේලාව ද, වන්දි ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු දිනය ද, පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

9 වන වගන්ති පරීක්ෂණ දිනය සහ වේලාව
**- 2024 සැප්තැම්බර් මස 27 පෙ. ව. 10.00 ට**

වන්දි ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු දිනය
**- 2024 සැප්තැම්බර් මස 20 වැනි දින.**

**අයි. ආර්. කේ. විතාරණ,**
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2024 ජූලි මස 23 වැනි දින,
වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0277

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.